1. ඊ-වාණිජ්‍ය පිළිබඳ පහත දක්වා ඇති ප්‍රකාශ සලකන්න.

A. අන්තර්ජාලය භාවිතා කර සිදුකරනු ලබන ව්‍යාපාරික කටයුතු ඊ-වාණිජ්‍යට අයත් ය.

B. ඊ-වාණිජ්‍ය තුළ දී ගෙවීම් සිදු කිරීම සඳහා භෞතික මුදල් භාවිතා වීමක් සිදු වේ.

C. ඊ-වාණිජ්‍ය තුළින් විශාල පාරිභෝගික ප්‍රමාණයක් වෙත භාණ්ඩ හා සේවා අලෙවි කිරීමේ හැකියාව ඇත.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1). A පමණි. (2). B පමණි. (3). A හා C පමණි.

(4). A හා B පමණි. (5). සියල්ලම නිවැරදිය.

2. ඊ -වාණිජ්‍ය හා ඊ-ව්‍යාපාර සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

(1). ඊ-වාණිජ්‍ය මඟින් ව්‍යාපාරයක අලෙවි කටයුතු, ප්‍රචාරණය, ගණුදෙනුකරුවන් සම්බන්ධ කරගැනීම වැනි කාර්යයන් සඳහා මූලිකත්වය ලබාදේ.

(2). ඊ-ව්‍යාපාර යන්නෙන් අදහස් වන්නේ ව්‍යාපාරයට බාහිර කටයුතු මෙන්ම අභ්‍යන්තර කටයුතු යන සියල්ලම තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක කිරීම.

(3). ඊ-වාණිජ්‍ය යනු ඊ - ව්‍යාපාරයක එක් අංශයක් පමණි.

(4). ඊ-වාණිජ්‍ය තුළ දී අන්තර්ජාලය පාදක කොටගත් වෙබ් අඩවි භාවිතා කරනු ලැබේ.

(5). ඊ-වාණිජ්‍ය තුළින් ව්‍යාපාරිකයෙකුට වැඩි ප්‍රතිලාභ ලබාගැනීමට ඇති හැකියාව අඩු මට්ටමක පවතී.

3. ඊ-වාණිජ්‍ය තුළ දී මුදල් ගෙවීම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන මාධ්‍යයක් නොවන්නේ කුමක් ද ?

(1). Credit Card (2). Debit Card (3). Smart Card

(4). Electronic Fund Transfer (5). Business Cheques

4. අංකිත ව්‍යාපාර ලෝකයේ දී වෙබ් අඩවි භාවිතා කරමින් පමණක් ව්‍යාපාර කටයුතු කරන ආයතනය හඳුන්වනු ලබන්නේ,

(1). Click Only Business (2). Click and Brick (3). Brick Only

(4). E-business (5). Online Business

5. ඊ-වාණිජ්‍යයේ (E-Commerce) වාසියක් නොවන්නේ පහත දක්වා ඇති කරුණු අතරින් කවරක් ද ?

(1). අඩු පිරිවැයකින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ හැකියාව පැවතීම.

(2). භෞතික සීමාවකින් තොරව ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ හැකියාව.

(3). පැය 24 පුරාම ව්‍යාපාරික කටයුතුවල නිරත වීමේ හැකියාව.

(4). ආකර්ශනීය ආකාරයෙන් අලෙවි කටයුතුවල නිරත වීමේ හැකියාව.

(5). අන්තර්ජාල පහසුකම් සියළු දෙනාටම නොමැති වීම නිසා ඊ-වාණිජ්‍යට යොමු වීමේ අපහසුව.

Scanned with CamScanner

6. අන්තර්ජාලය භාවිතා කරමින් මෙන්ම සාම්ප්‍රදායික ක්‍රමයට ව්‍යාපාර කටයුතු කරන ආයතන හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?
(1). Click Only (2). Brick and Click (3). Brick Only
(4). E-business (5). Online Business

7. shopping bot භාවිතා කරනු ලබන්නේ කුමන අරමුණක් සඳහා ද ?
(1). තෝරාගත් භාණ්ඩයක් සඳහා ඇති හොඳම මිල ගණන ඇති වෙබ් අඩවිය සොයා ගැනීමට යොදා ගනු ලබන පරිගණක වැඩසටහනක් මේ නමින් හැඳින්වේ.
(2). අන්තර්ජාලයේ ඇති වෙබ් අඩවි වර්ගයක් මේ නමින් හැඳින්වේ.
(3). මාර්ගගත අලෙවි කටයුතු සිදුකරන සියළු වෙබ් අඩවි මේ නමින් හඳුන්වනු ලැබේ.
(4). කිසියම් භාණ්ඩ වර්ගයක් සඳහා අවශ්‍ය මිල ගණන් දර්ශනය කරනු ලබන වෙබ් අඩවි මේ නමින් හැඳින්වේ.
(5). ඉහත කිසිවක් නොවේ.

8. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පුරවැසි හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාල තොරතුරු ලබාදීමට වෙබ් අඩවියක් සැකසීමට තීරණය කර ඇත. මෙම සේවාව අයත්වන්නේ කුමන ඊ-ව්‍යාපාර වර්ගයට ද ?
(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C

9. ව්‍යාපාර ආයතනයක් තම නිෂ්පාදන වෙනත් ව්‍යාපාර ආයතන වෙත අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීමක් සිදු කළහොත් එය අයත් වන්නේ කුමන ඊ-ව්‍යාපාර වර්ගයට ද ?
(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C

10. පාරිභෝගිකයෙක් තවත් පාරිභෝගිකයෙකුට අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ අලෙවි කිරීමක් සිදු කරන ලදී. මෙය අයත් වන්නේ කුමන ඊ-ව්‍යාපාර වර්ගයට ද ?
(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C

11. නිමල් තමා භාවිතා කරන ලද ජංගම දුරකතනය අලෙවි කිරීම සඳහා අන්තර්ජාලයේ දැන්වීමක් පළ කරන ලදී. ඒ අනුව හේරත් නැමැත්තෙක් අන්තර්ජාලය ගවේෂණය කරන විට එම දැන්වීම දැක අදාල ජංගම දුරකතනය මිලදී ගන්නා ලදී. මෙම ගණුදෙනුව අයත් වන්නේ කුමන ඊ-ව්‍යාපාර වර්ගයට ද ?
(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C

12. භාණ්ඩ ගැණුම් කරුවන් රාශියක් ඒකරාශි වී තමන්ට අවශ්‍ය භාණ්ඩ එකවර තොගයක් ලෙස මිලදී ගනිමින් විශේෂ වට්ටම් වාසි ලබාගැනීමක් සිදු කරනු ලැබේ. මෙවැනි ව්‍යාපාරික ගණුදෙනු අවස්ථාවක් ඊ-වාණිජ්‍යයේ දී හඳුන්වනු ලබන්නේ,
(1). කණ්ඩායම් මිලදී ගැනීම් ලෙස (Group Purchasing) (2). අන්තර්ගතය සපයන්නන් (Content Provider)
(3). Web Portal (4). E-Distributer
(5). E-Purchaser

13. අන්තර්ජාලය තුළ දී පුද්ගලයින්ට අවශ්‍ය වන බොහෝ තොරතුරු එක් ස්ථානයකින් ලබාගත හැකි ලෙස සකසා ඇති වෙබ් අඩවි හඳුන්වන නාමය වන්නේ ?
(1). E-Commerce Site (2). Service Provider (3). Web Portal
(4). E-Distributer (5). E-Purchaser

14. පුද්ගලයෙක් විසින් වෙබ් අඩවියක් හරහා කොටස් වෙළඳපලේ ඇති තම කොටස්, කොටස් වෙළඳපලෙහි වෙනත් ගනුදෙනුකරුවෙකුට විකිණීම කිනම් ගනුදෙනු වර්ගයකට අයත් වේද?
(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C


15. නිවසේ හෝ කාර්යාලයේ සිට තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා අන්තර්ජාලය තුළින් ගෙන්වා ගැනීම හඳුන්වනු ලබන්නේ,
(1). අන්තර්ජාල වෙළඳාම (2). මාර්ගගත සාප්පු යාම (Online Shopping)
(3). E-Marketing (4). E-Sales (5). E-Business

Scanned with CamScanner

16. ඊ-වාණිජ්‍ය තුළ දක්නට ලැබෙන ව්‍යාපාර ආකෘති අතරින් රජයට සම්බන්ධ ආකෘතියක් වන්නේ කුමක් ද ?

(1). Business - to - Business (B2B)
(2). Business - to - Consumer (B2C)
(3). Consumer - to - Consumer (C2C)
(4). Consumer - to - Business (C2B)
(5). Government - to - Citizen (G2C)


17. පහත රූපසටහන අධ්‍යයනය කරන්න.




මෙමගින් නිරූපණය කරනු ලබන්නේ කුමන ඊ-ව්‍යාපාර වර්ගයක් ද ?

(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C


18. පහත රූපසටහන අධ්‍යයනය කරන්න.




මෙමගින් නිරූපණය කරනු ලබන්නේ කුමන ඊ-ව්‍යාපාර වර්ගයක් ද ?

(1). B2C (2). B2B (3). C2C (4). C2B (5). G2C

19. පහත රූපසටහන අධ්‍යයනය කරන්න.




මෙම රූපසටහනේ දැක්වෙන ආකෘතිය මඟින් පෙන්වන ඊ-ව්‍යාපාර වර්ගය කුමක්ද ?

(1). B2B (2). C2B (3). B2C (4). G2B (5). C2C

Scanned with CamScanner

20. අන්තර්ජාල ගණුදෙනුවලදී භාවිතා කරනු ලබන ගෙවීම් ක්‍රමවේදයකට අදාල තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
A. ගිණුමේ මුදල් නොමැතිව කාඩ්පත භාවිතා කර ගෙවීම් සිදු කිරීමට හැකියාව ඇත.
B. ලබාදී ඇති ණය සීමාව තුළ ගණුදෙනු කිරීමේ හැකියාව පවතින අතර, මාසිකව ගණුදෙනුවලට අදාල සාරාංශයක් කාඩ්පත් හිමියා වෙත ලැබේ.
C. මෙම කාඩ්පත් මගින් කරන ගණුදෙනු සඳහා අදාල මූල්‍ය ආයතනයෙන් සපයන ණය පහසුකම වෙනුවෙන් පොළියක් කාඩ්පත් හිමියාගෙන් අය කරනු ලැබේ.

ඉහත ප්‍රකාශ මගින් විස්තර වන කාඩ්පත් වර්ගය වන්නේ,
(1). Debit Card (2). Credit Card (3). Online Card
(4). Bank Card (5). මෙහි දක්වා ඇති කිසිවක් නොවේ.

21. ඊ-වාණිජ්‍ය වෙබ් අඩවියක අන්තර්ගතය පිළිබඳ පහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගන්න,
A. මුදල් ගෙවීම් ක්‍රමවේදයක් ඊ-වාණිජ්‍ය වෙබ් අඩවියක අඩංගු කර තිබිය යුතුය.
B. Shopping cart (මිලදී ගන්නා සේවා හෝ භාණ්ඩ ඒකරාශී කිරීම) පහසුකම් අඩංගු කර තිබීම.
C. සෙවීමේ (Search) පහසුකම අඩංගු කර නොතිබීම.
ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
(1). A පමණි. (2). B පමණි. (3). C පමණි.
(4). A හා B පමණි. (5). සියල්ලම නිවැරදිය.

22. අන්තර්ජාල වෙබ් අඩවි භාවිතා නොකර සාම්ප්‍රදායික ක්‍රමවේදය ඔස්සේ ව්‍යාපාරික කටයුතු සිදුකරන ආයතනයක් අංකිත ආර්ථිකය තුළ හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?
(1). Click Only (2). Click and Brick (3). Brick Only
(4). E-business (5). Online Business

23. අතත්‍ය ප්‍රජාව (Virtual Communities) යනුවෙන් අදහස් කරන්නේ කවුරුන්ද ?
(1). අන්තර්ජාලය තුළ පවත්නා සමාජ ජාල වෙබ් අඩවියක් ඔස්සේ ඒකරාශි වී ඇති පුද්ගලයින් මේ නමින් හැඳින්වේ.
(2). අන්තර්ජාලය තුළින් ව්‍යාපාරික ගණුදෙනුවල නිරතවන ව්‍යාපාරිකයින් මේ නමින් හැඳින්වේ.
(3). පරිගණක භාවිතා කරන පුද්ගලයින් මේ නමින් නම් කරනු ලැබේ.
(4). ඊමේල් පණිවිඩ හා සම්බන්ධව කටයුතු කරනු ලබන ප්‍රජාව මේ නමින් හැඳින්වේ.
(5). ඉහත කිසිවක් නොවේ.

24. වෙබ් සර්වරය (Web Server) සහ වෙබ් අතරික්සුව (Web Browser) අතර සුරක්ෂිතව දත්ත සම්ප්‍රේෂණය කිරීමේදී භාවිතා වන නියමාවලිය වනුයේ,
(1). SSL (2). HTTPS (3). HTTP (4). SMTP (5). FTP

25. Affiliate marketing යනු අන්තර්ජාලය ඔස්සේ සිදුකරනු ලබන ව්‍යාපාරික කටයුත්තකි. මින් අදහස් වන්නේ,
(1). වෙනත් වෙබ් අඩවියක අලෙවියට ඇති භාණ්ඩ හෝ සේවා තම වෙබ් අඩවිය ඔස්සේ අලෙවි කිරීමට හැකියාව ලැබෙන ලෙස දැන්වීම් හෝ සම්බන්ධක යොදා සැකසීම හා ඒ තුළින් අලෙවි වන භාණ්ඩවලට යම් කොමිස් මුදලක් ලබාගැනීම.
(2). වෙබ් අඩවියක් තුළින් තම ආයතනයේ ම භාණ්ඩ හා සේවා අලෙවි කිරීමයි.
(3). වෙනත් අයෙකුගේ භාණ්ඩ පිළිබඳව තම වෙබ් අඩවියෙන් නොමිලේ ප්‍රචාරණය කර දීමයි.
(4). අන්තර්ජාලය භාවිතා නොකර වෙනත් ආයතනයක භාණ්ඩ හා සේවා අලෙවි කිරීමයි.
(5). වෙනත් වෙබ් අඩවියක අලෙවියට ඇති භාණ්ඩ හෝ සේවා තම වෙබ් අඩවිය ඔස්සේ අලෙවි කිරීමට හැකියාව ලැබෙන ලෙස දැන්වීම් හෝ සම්බන්ධක යොදා සැකසීම හා ඒ සඳහා කිසිඳු ගාස්තුවක් අය නොකිරීම.

26. සේවාදායකයින්ට තම කාලය ඉතිරි කරගැනීමට උපකාර වෙමින් අන්තර්ජාලය වැනි මාධ්‍යයන්ගෙන් තොරතුරු සොයාදීම මගින් යම් මුදලක් උපයා ගන්නා පුද්ගලයින් හෝ ආයතන හඳුන්වනු ලබන්නේ,
(1). වෙළඳ පර්යේෂකයින් (2). තොරතුරු තැරැව්කරුවන් (3). සමීක්ෂකයින්
(4). සමාජ වෙබ් අඩවි ජාල හිමියන් (5). අන්තර්ජාල සේවා සපයන්නන්

Scanned with CamScanner

27. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A. Shopping Bot යනු අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ වල මිළ ගණන් සසඳා ඒ අතරින් වඩාත් හොඳම මිළ ගණන් පාරිභෝගිකයා වෙත සොයා දීමට භාවිතා කරන මෘදුකාංග වර්ගයකි.

B. Shopping Bot ඊ-වාණිජ්‍ය සංකල්පයට සම්බන්ධතාවයක් දක්වයි.

C. Shoppinglist.com, StoreRunner.com වඩාත් ජනප්‍රිය Shopping Bot වෙබ් අඩවි කිහිපයකි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1). A පමණි. (2). B පමණි. (3). C පමණි.
(4). A හා B පමණි. (5). සියල්ලම නිවැරදි වේ.

28. අන්තර්ජාලයේ වෙබ් අඩවියක් තුළ දැන්වීමක් පළ කර පුද්ගලයෙකු භාවිතා කරන ලද පරිගණකයක් තවත් අයෙකුට අලෙවි කිරීම අයත් වන්නේ,

(1). B2C (2). C2B පමණි. (3). C2C (4). B2G (5). G2C

29. කාන්තාවක් තමන්ට අවශ්‍ය සුවඳ විලවුන් වර්ගයක් අන්තර්ජාලයට යොමු වී වෙබ් අඩවියක් ඔස්සේ ගෙවීම් සිදුකර තම නිවසටම ගෙන්වා ගන්නා ලදී. මෙය හඳුන්වනු ලබන්නේ

(1). විද්‍යුත් ඊමේල් (E-mail) (2). C2B පමණි. (3). C2C.
(4). මාර්ගගත සාප්පු යාම (Online Shopping) (5). G2C

30. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A. තරඟකාරි මිළ ගණන් යටතේ භාණ්ඩ මිලදී ගත හැකිවීම.

B. කාලය නාස්තිය කරගැනීම අවම කරගැනීමට හැකිවීම.

C. සාමාන්‍ය මුදල් නෝට්ටු භාවිතයේ දී ඇති වන ගැටළුවලට පාරිභෝගිකයාට මුහුණ දීමට සිදු නොවීම.

D. ඇණවුම් කළ භාණ්ඩ විශ්වාසවන්තව ලබාගැනීමට හැකිවීම.

ඉහත ප්‍රකාශයන්ගෙන් ඊ-වාණිජ්‍ය හා සම්බන්ධව වාසිදායක තත්ත්වයන් වන්නේ,

(1). A,B,D පමණි (2). A,B,C පමණි (3). A,C,D පමණි (4). B,C,D පමණි (5). සියල්ලම

31. භාණ්ඩ මිලදී ගන්නන් කිහිප දෙනෙකු එකට එක්වී තොගයක් ලෙස භාණ්ඩ මිලදී ගනිමින් වට්ටම් ලබාගනිමින් වෙළඳපොල වාසි සලසා ගැනීම ඊ-වාණිජ්‍යයේ දී හඳුන්වනු ලබන්නේ,

(1). E-Marketplace (2). E-Distributor (3). Group Purchasing
(4). Content Provider (5). E-tailor

32. ප්‍රතිවෙන්දේසි (Reverse Auction) පිළිබඳ පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A. ගැණුම්කරුට අඩු මිලකට තරඟකාරීව භාණ්ඩ මිලදී ගැනීමට හැකිවීම.

B. විකුණුම්කරුට වැඩිම මිලකට භාණ්ඩ අලෙවි කිරීමට හැකියාව ලැබීම.

C. විකුණුම්කරුවන් කිහිප දෙනෙකු මිළ ගණන් ඉදිරිපත් කිරීම තුළින් අඩුම මිළ යටතේ භාණ්ඩ ලබාගැනීමට හැකිවීම.

D. ගැණුම්කරු තමාට අවශ්‍ය භාණ්ඩ වර්ගය ඉදිරිපත් කළ විට විකුණුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීම සිදුවේ.

ඉහත ප්‍රකාශ අතරින් ප්‍රතිවෙන්දේසි සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ කුමන ප්‍රකාශයන් ද ?

(1). A,D පමණි (2). A,C පමණි. (3). A,B,C පමණි (4). A,C,D පමණි (5). සියල්ලම

33. පහත ප්‍රකාශ සැලකිල්ලට ගන්න.

A. පාරිභෝගිකයින් ප්‍රමාණය වැඩි කරගැනීමට හැකිවීම.

B. පැය 24 පුරාම අලෙවි කටයුතුවල නිරතවීමට හැකිවීම.

C. තරඟකාරීත්වය තුළින් අඩු මිලක් යටතේ භාණ්ඩ මිලදී ගැනීමට හැකිවීම.

Scanned with CamScanner

ඉහත ප්‍රකාශ අතරින් ඊ වාණිජයේ තුළින් ව්‍යාපාරිකයාට ලැබෙන වාසියක් නොවන්නේ,

(1). A (2). B (3). C (4). A,B (5). A,C

34. ඊ-වාණිජ්‍ය තුළින් පාරිභෝගිකයාට ලැබෙන වාසියක් නොවන්නේ කුමක් ද ?
   (1). ඕනෑම අවස්ථාවක භාණ්ඩ මිලදී ගැනීමට හැකියාව ලැබීම.
   (2). අනෙකුත් පාරිභෝගිකයින් සමඟ අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමට හැකිවීම.
   (3). තරඟකාරිත්වය තුළින් අඩු මිලක් යටතේ භාණ්ඩ ලබාගැනීමට හැකිවීම.
   (4). ඕනෑම ස්ථානයක සිට ඊ-වාණිජ්‍ය හා සම්බන්ධ වීමට හැකියාව ලැබීම.
   (5). ආකර්ශනීය ආකාරයට ප්‍රචාරණ කටයුතුවල නිරතවීමේ හැකියාව.

35. ඊ-වාණිජ්‍ය ව්‍යාප්ත නොවීමට බලපාන සාධකයක් නොවන්නේ කුමක් ද ?
   (1). අන්තර්ජාල පහසුකම් ව්‍යාප්තව නොතිබීම.
   (2). පරිගණක භාවිතය පිළිබඳ දැනුම වැඩිහිටි පරම්පරාවට අඩු වශයෙන් පැවතීම.
   (3). මුදල් ගෙවීමට භාවිතා කරන විද්‍යුත් ක්‍රමවේද සෑම අයෙකුටම නොමැතිවීම.
   (4). ඇණවුම් කළ භාණ්ඩ අතට පත්වන තෙක් ඇති අවිශ්වාසය.
   (5). පැය 24 පුරාම ගණුදෙනු කිරීමේ හැකියාව ලැබීම.

36. අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාර (Virtual Store Front) පිළිබඳ නිවැරදි නොවන පිළිතුර වනුයේ,
   (1). අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාරයක් යනු ව්‍යාපාරික වෙබ් අඩවියකි.
   (2). පාරිභෝගිකයන්ට භාණ්ඩ හා සේවාවන් විමසීමට හැකි ස්ථානයකි.
   (3). පාරිභෝගිකයන්ට භාණ්ඩ ඇණවුම් කළ හැකි ස්ථානයකි..
   (4). මෙහිදී මුදල් ගෙවීමේ හැකියාව පවතී.
   (5). භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීමේ හැකියාව පවතින ස්ථානයකි.

37. Ebay.com වෙබ් අඩවියට යොමු වී සෙනරත් විසින් කැමරාවක් ලබාගැනීම සඳහා තම ක්‍රෙඩිට් කාඩ්පතෙන් මුදල් ගෙවීමක් සිදුකරන ලදී. මෙම ගණුදෙනුව අයත් වන්නේ,

   (1). B2B (2). B2C (3). B2G (4). G2C (5). B2E

38. ඊ-වාණිජ්‍ය වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණුවලට අයත් නොවන්නේ කුමක්ද ?

   (1). ආරක්ෂාව (Security) (2). පෞද්ගලිකත්වය (Privacy) (3). නීතිමය ගැටළු (Legal issued)
   (4). වේගය (Speed) (5). පාරිභෝගික ප්‍රමාණය (Customers)

39. E-market place යනු,
   (1). අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම සහ ලබාගැනීමට ව්‍යාපාරිකයින් හා පාරිභෝගිකයින් කටයුතු කරන වෙබ් අඩවි මේ නමින් හැඳින්වේ.
   (2). විද්‍යුත් උපාංග අලෙවි කරනු ලබන වෙළඳපොළ මේ නමින් හැඳින්වේ.
   (3). ඊමේල් භාවිතා කර අලෙවි කටයුතු සිදුකරනු ලබන ක්‍රමවේදයකි.
   (4). ආයතන විසින් තම තොරතුරු ප්‍රදර්ශනය කිරීමට භාවිතා කරන වෙබ් අඩවි සමූහයක් මේ නමින් හැඳින්වේ.
   (5). අන්තර්ජාලයේ භාණ්ඩ වෙන්දේසි සිදුකිරීම සඳහා පමණක් ස්ථාපිත කර ඇති වෙබ් අඩවි මේ නමින් හැඳින්වේ.

40. පාරිභෝගිකයෙකුට වෙබ් අඩවියක් වෙත යොමු වී තමාට අවශ්‍ය භාණ්ඩ වර්ගය සහ එය ලබාගැනීමට බලාපොරොත්තු වන මිල සඳහන් කිරීමේ හැකියාව පවතී. ඊ-වාණිජ්‍යට සම්බන්ධ එවැනි වෙබ් අඩවියක් හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?

   (1). B2C (2). C2B (3). C2C (4). B2G (5). G2C

41. Amazon.com වෙබ් අඩවිය අයත් වන්නේ,

   (1). B2C (2). C2B (3). C2C (4). B2G (5). G2C

Scanned with CamScanner

42. අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ හා සේවා පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදුකිරීම සඳහා යොදා ගතහැකි ක්‍රමවලට අයත් නොවන්නේ කුමක් ද ?

(1). Email Marketing (2). Affiliated Marketing (3). Search Enging Marketing
(4). Pay per Click (5). Handbill

43. පහත කරුණු සැලකිල්ලට ගන්න.

A. වෙබ් අඩවියක පළකරනු ලබන දැන්වීම් වෙත ක්ලික් කළ විට මුදල් ලබාගත හැකි ක්‍රමවේදයක් ලෙස PPC - Pay Per Click හඳුන්වා දීමට පුළුවන.
B. සාමාන්‍ය වෙබ් අඩවි හිමිකරුවන්ට වුවද තම වෙබ් අඩවිය තුළ මෙවැනි දැන්වීම් පළකරවා ගැනීමට පුළුවන.
C. අන්තර්ජාලය තුළ පවත්නා නීති විරෝධි ප්‍රචාරණ ක්‍රමවේදයකි.

ඉහත ප්‍රකාශ අතරින් Pay Per Click සම්බන්ධව නිවැරදි වන්නේ,

(1). A පමණි (2). A,B පමණි (3). A,B,C පමණි (4). A,C පමණි (5). සියල්ලම

44. ක්‍රෙඩිට් කාඩ්පත් මගින් සිදුකරනු ලබන ගණුදෙනුවල අවාසියක් වන්නේ කුමක් ද ?

(1). පුද්ගලයෙකු සතු ක්‍රෙඩිට් කාඩ්පතකින් තවත් පුද්ගලයෙකුට ගෙවීමක් සිදු කිරීමේ හැකියාව නොමැත.
(2). රහස්‍ය භාවය තබාගැනීමට නොහැක.
(3). අන්තර්ජාලය ඔස්සේ හැර වෙනත් ක්‍රමවේද ඔස්සේ ගෙවීම් සිදුකළ නොහැක.
(4). ගිණුමේ ශේෂය ණය සීමාව ඉක්මවිය නොහැක.
(5). ආරක්ෂාවක් නොමැත.

45. පළාත් සභාවක් විසින් තම පළාතේ වාහන හිමියන් වෙත රථවාහන ආදායම් බලපත්‍ර ලබාදීම මාර්ගගතව සිදු කරනු ලබයි. මේ සඳහා විශේෂ වෙබ් අඩවියක් උපයෝගී කරගනු ලැබේ. මෙම සේවාව අයත් ව්‍යාපාර වර්ගය හඳුන්වනු ලබන්නේ ?

(1). B2C (2). C2B (3). C2C (4). B2G (5). G2C

46. වෙබ් අඩවියක් තුළින් තෙවන පාර්ශ්වයක (වෙනත් බාහිර ව්‍යාපාර) භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට ඉඩ ලබාදී අලෙවි භාණ්ඩයේ හෝ සේවාවේ වටිනාකමෙන් ප්‍රතිශතයක් අය කිරීම හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද ?

(1). ඊ-වාණිජ්‍ය (2). ඊ-ව්‍යාපාර (3). අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාර
(4). මාර්ගගත සාප්පුව (5). අන්තර්ගතය සපයන්නා

47. සාමාජිකයන්ගේ සාමුහික මිලදී ගැනීමේ ශක්තිය උපයෝගී කරගෙන අන්තර්ජාලයේ භාණ්ඩ හා සේවා අලෙවි කරනු ලබන ව්‍යාපාරිකයින්ගෙන් වට්ටම් ලබාගැනීම කුමන නමකින් හඳුන්වනු ලබන්නේ ද ?

(1). කණ්ඩායම් ලෙස මිලදී ගැනීම (2). භාණ්ඩ වට්ටමට ලබාගැනීම
(3). අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාර (4). මාර්ගගත සාප්පු යාම (5). ප්‍රතිවෙන්දේසිය

48. ප්‍රවෘත්ති, බ්ලොග්, වීඩියෝ, සින්දු වැනි නිතර අලුත් කරන තොරතුරු වැනි දෑ මාර්ගගතව සැපයීම හඳුන්වනු ලබන්නේ ?

(1). අතත්‍ය වෙළඳ ප්‍රදර්ශනාගාර (2). අන්තර්ගතය සපයන්නා (3). තොරතුරු තැරව්කරු
(4). ප්‍රතිවෙන්දේසිය (5). ඊ-ව්‍යාපාර

49. පහත කරුණු සැලකිල්ලට ගන්න.

A. ඕනෑම අයෙකුට පොදුවේ ලබාගත හැකි තොරතුරු රැස් කිරීම සහ ඒවා වෙනත් ආයතන වෙත ලබාදීම.
B. පාරිභෝගිකයින්ට අදාල තොරතුරු රැස් කොට විශ්ලේෂණය කර වෙනත් ආයතන වෙත ලබාදීම.
C. අන්තර්ජාලය තුළින් භාණ්ඩ හා සේවා අලෙවි කිරීම

ඉහත කරුණු අතරින් තොරතුරු තැරව්කරු අයත් කාර්යයන් ප්‍රකාශවන පිළිතුර නිවැරදිව දක්වා ඇත්තේ,

(1). A සහ B (2). B පමණි (3). A, C පමණි (4). A පමණි (5). සියල්ලම

Scanned with CamScanner